නිපුණතාව 5.0 - මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.

නිපුණතා මට්ටම - 5.7 - උපලබ්ධි සංකල්පය යොදා ගනියි.

5.8 - ගැලපුම් සංකල්පය භාවිත කරයි.

**උපලබ්ධි සංකල්පය** - ආදායම සත්‍ය වශයෙන් ඉපයූ අවස්ථාවේ දී එම ආදායම හඳුනා ගත යුතු බව මෙම සංකල්පයෙන් අදහස් කෙරේ.

**සංකල්පයේ යෙදීම් -**

- විකුණුම් අත්තිකාරම් - අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට මාරු වී නැත.එම නිසා ආදායමක් ලෙස හඳුනා ගත නොහැක.
- ණයට විකුණුම් - මුදල් නොලැබුණද භාණ්ඩවල අයිතිය හුවමාරු වී එහි ප්‍රතිලාභ සහ අවදානම ගැනුම්කරුට මාරු වී ඇත.ඒ නිසා ආදායමක් සේ සලකයි.
- භාණ්ඩ විකුණා ඇතත් භාණ්ඩ රැගෙන ගොස් නොතිබීම.එහි අයිතිය හුවමාරු වී ඇත.එය ආදායමක් සේ සැලකේ.
- විකිණීම හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති භාණ්ඩ - මෙහි අයිතිය හුවමාරු වී නොමැති නිසා මෙය ආදායමක් ලෙස හඳුනා නොගනී.

**අභ්‍යාස**

1.ගැලපුම් සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරන්න.

2.ගැලපුම් සංකල්පය මූල්‍ය ප්‍රකාශනවල යෙදෙන අවස්ථා දක්වන්න.

3.රු.14,000ක් වටිනා තොගයක් හානි වූ අතර,ඒ සඳහා රක්ෂණ ආයතනයක් 50%ක් ලබා දීමට එකඟ වේ.අදාළ ගැලපුම් සටහන ලියා දක්වා එයින් ලාභයට වන බලපෑම දක්වන්න.